# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

## 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

## සමාජීයවිද්‍යා පීඨය

## ආර්ථික විද්‍යාව

## ආර්ථකවිද්‍යා මූලධර්ම ECON E - 1015

ප්‍රශ්න පහකට ( 05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය (03)

---

1. විෂයයේ ස්වභාවය , ක්‍රමවේදය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ආර්ථික විද්‍යා විෂය පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 20)

2. (අ) ආවස්ථික පිරිවැය සංකල්පය මගින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) කල්පිත සංඛ්‍යා දත්ත යොදා ගනිමින් විවිධ වර්ගයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ගොඩනංවා ඒවායේ ආවස්ථික පිරිවැයේ හැසිරීම පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. තරඟකාරී වෙළඳපොලක ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහතින් දැක්වේ.

$$Q_d = 2000 - 10P$$
$$Q_s = -500 + 10P$$

   (අ) සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)
   (ආ) සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාව සහ මිල සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)
   (ඇ) මිල රු: 110/= ත් මිල රු: 125/= ත් අතරතුර මිල ඉල්ලුම් නම්‍යතාවත් මිල රු: 125/= ත් රු: 140/= ත් අතරතුරදී සැපයුම් නම්‍යතාවත් ගණනය කරන්න. (ලකුණු 04)
   (ඈ) මිල රු: 105/= අධි ඉල්ලුමත් , මිල රු: 145/= දී අධි සැපයුමත් ගණනය කරන්න. (ලකුණු 05)
   (ඉ) තරඟකාරී වෙළඳපොලේ අධි ඉල්ලුම සහ අධි සැපයුම ඉවත් කිරීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිපත්ති පැහැදිලි කරන්න. (ලකුණු 07)

4. (අ) උචිත රූප සටහනක් භාවිතයෙන් කෙටිකාලීන නිෂ්පාදනයේ අවධි බෙදා දක්වන්න. (ලකුණු 10)
   (ආ) තාර්කිකව කටයුතු කරන ආයතනයක් දෙවන අවධිය තුළ රැඳීමට උත්සාහ දරන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (ඇ) කෙටිකාලීන සහ දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිත අතර වෙනස දක්වන්න. (ලකුණු 06)

5. කෙටිකාලීන පිරිවැය වක්‍රවල හැඩය තීරණය වන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 20)

6. I. කෙටිකාලීන පිරිවැය වක්‍ර සහ දිගුකාලීන පිරිවැය වක්‍ර අතර පවත්නා සම්බන්ධතාව කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 12)

II. "දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැඩය තීරණය වනුයේ පරිමාණානුකූල ඵල පිළිබඳ නියමය අනුවයි." සාකච්ඡා කරන්න. (ලකුණු 08)

7. I. පූර්ණ තරඟකාරී වෙළඳපොල ආදර්ශයේ උපකල්පන මොනවාද? (ලකුණු 05)

II. පූර්ණ තරඟකාරී කර්මාන්තයක් සහ පූර්ණ තරඟකාරී ආයතනයක් අතර පවතින වෙනස දක්වන්න. (ලකුණු 05)

III. "පූර්ණ තරඟකාරී ආයතනයකට කෙටි කාලයේදී අති ප්‍රමාණික ලාභ ඉපයිය හැකි නමුත් දිගු කාලයේදී ඉපයිය හැකිවනුයේ ප්‍රමාණික ලාභ පමණි." පැහැදිළි කරන්න. (ලකුණු 10)

8. (අ) ඒකාධිකාරී කර්මාන්තයක් යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිළි කරන්න.(ලකුණු 08)

(ආ) "ඒකාධිකාරී කර්මාන්තයකට කෙටිකාලයේදී මෙන්ම දිගුකාලයේදීද අති ප්‍රමාණික ලාභ ඉපැයිය හැකිය." මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 12)

9. "භූමියට පමණක් නොව සියලුම නිෂ්පාදන සාධක වලට ආර්ථික බදු කුළියක් ඉපයිය හැකිය" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 20)

10. විවෘත ආර්ථිකයක් සම්බන්ධව පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත. (සියලු සංඛ්‍යා රු.ද.ල. වලිනි)

$C = 200 + 4/5\ Y_d$ $X = 300$

$I = 300$ $M = 200$

$G = 400$

$T_D = 100$

(අ) සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 06)

(ආ) සමතුලිත ආදායම් මට්ටමේදී පරිභෝජන වියදම සහ ඉතුරුම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 03)

(ඇ) ජාතික ආදායම් ගුණකයේ අගය කොපමණද? (ලකුණු 02)

(ඈ) රජයේ වියදම රු.ද.ල. 400 සිට රු.ද.ල. 500 දක්වා වැඩිවූයේ යැයි සලකන්න. නව සමතුලිත ජාතික ආදායම කොපමණද ? රජයේ වියදම් ගුණකයේ අගය කොපමණද? (ලකුණු 05)

(ඉ) විවෘත ආර්ථිකයක සමතුලිත ජාතික ආදායම තීරණය වන ආකාරය රූප සටහනක් මගින් පැහැදිළි කරන්න. (ලකුණු 04)

**********************